**කල්මුණේ මහානගර සභාව - 2020**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කල්මුණේ මහානගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහානගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට කල්මුණේ මහානගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහානගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහානගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහානගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහනගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහානගර සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු සහ සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් 44 ක හා වාහන 55 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණු අතර සමාලෝචිත වසර අවසාන වන විටත් ඒවා තක්සේරු කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල කටයුතු දැනට සිදුකරනු ලැබේ. | වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතුය. |
| (ආ) | 2011 – 2015 කාල පරිච්ඡේදය තුල සන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු සඳහා කරෙයිතිවු ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ගාස්තුව රු. 2,046,823 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු වියදම් මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඇ) | ප්‍රදර්ශනය කර තිබු දැන්වීම් පුවරු 06 කින් අයවිය යුතු රු. 308,640 ක් ගිණුම් වල දක්වා නොතිබුණි. | ඉදිරියේදි මෙය නිවැරදි කරනු ලැබේ. | අයවිය යුතු ආදායම් මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඈ) | ලැබිය යුතු හා අත්තිකාරම් වශයෙන් ලැබුණු දැන්වීම් ගාස්තු පිළිවෙලින් රු. 3,130,575 ක් සහ රු. 372,205 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ඉදිරියේදි මෙය නිවැරදි කරනු ලැබේ. | ලැබුණු ආදායම් මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ නිම කරන ලද රු.1,406,487 ක් වටිනා ඉදිකිරීම් කර්මාන්ත වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදි මෙය නිවැරදි කරනු ලැබේ. | වැඩ අවසන් කරන ලද ඉදිකිරීම් වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඊ) | ඉතිරි කිරීම් තැන්පත් වලින් ලැබුණු පොළී ආදායම් රු. 13,876 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ඉදිරියේදි මෙය නිවැරදි කරනු ලැබේ. | පොළී ආදායම් මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 4,368,372 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 18,437,411 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු. 3,729,893 ක තැන්පතු මුදල් සහිත අක්‍රීය බැංකු ගිණුම් 04 ක්, නැවත සක්‍රීය කිරීමට හෝ එම මුදල සභාවේ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | තැන්පතු ශේෂ ඵලදායීව ආයෝජනය කළයුතුය. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු** | | |
| මහා නගර සභා ආඥා පනතේ 252(1)(ආ) වගන්තිය අනුව මහ නගර සභා බල ප්‍රදේශයේ තිබෙන නිශ්චල දේපල සහ ඉඩම් 47,900 කින් වර්ෂයට අධික කාලයක සිට අයවිය යුතු වරිපනම් බදු රු. මිලියන 91.6 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර නොතිබුණු අතර වරිපනම් ගෙවීම් පැහැර හරින ලද වත්කම් 14,769 ක අයිතිකරුවන්ට එරෙහිව නිත්‍යානුකූලව කටයුතු කරද නොතිබුණි. | දැනට අය නොවන ආදායම් අයකර ගැනීමට කටයුතු කර ඇත. | නිශ්චිත කාල පර්විඡේදය තුල බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ රජයේ බස් නැවතුම් පොළ කඩ කාමර හිඟ මුදල රු. 4,219,400 ක් කල්මුණේ පොල කඩ කාමර හිඟ මුදල රු. 3,907,615 ක් ඒකාබද්ධ එක්සත් චතුරශ්‍ර කඩ කාමර හිඟ මුදල රු. 1,735,750 ක් කෙසෙල් කඩ කාමර හිඟ මුදල රු. 613,995 ක් සහ පෞද්ගලික බස් රථ නැවතුම් පොල සහ කඩ කාමර හිඟ කුලී රු. 450,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිකරුවන්ට එරෙහිව නීතියානුකූලව කටයුතු කෙරමින් පවති. | ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ) බලපත්‍ර ගාස්තු** | | |
| මහානගර සභා බල ප්‍රදේශයේ වෙළඳ ස්ථාන 3,417ක් පැවැති නමුත්, සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ස්ථාන 1,036කින් රු. 2,461,100 ක් පමණක් අයකර ගෙන තිබුණි. | අයහපත් තත්ත්වය හේතුවෙන් අයකර ගැනීමට නොහැකිවිය. | ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **දැන්වීම් පුවරු ගාස්තු**

| | | |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු 870 ක් ප්‍රදර්ශනය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දැන්වීම් පුවරු 113 කින් පමණක් රු. 539,890 ක් අයකර තිබුණි. | දැනට අදාල ආදායම් අය වෙමින් පවති. | ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයතුල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතා ලබා දීම සඳහා මහානගර සභා බල ප්‍රදේශය තුල ප්‍රතිලාභීන් 1,951 කට ජල සම්බන්ධතා ලබා දීමේදි පළුදුවූ මාර්ගය නැවත සකස්කිරීම සඳහා රු. 1,401,715 ක මුදලක් අයකර තිබුණද, මාර්ග 250 ක් පමණක් සභාව විසින් ප්‍රතිසංස්කරනය කර තිබුණි. | දැනට කටයුතු කරමින් පවති. | මාර්ග ප්‍රතිසංස්කරනය කඩිනමින් සිදු කළ යුතුය. |
| (ii) | සභා අරමුදලින් රු. 124,969 ක් යොදවා ශිෂ්‍යයන් සඳහා උපකරණයන් මිලදී ගෙන 2015 ජුනි 30 වන දින පාසලකට භාර දුන් බව දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම භාණ්ඩ පාසලට භාරදී නොතිබුණි. | දැනට අදාල කටයුතු කෙරමින් පවති. | තෝරාගත් පාසලට උපකරණ ලබා දීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සම්මත කොන්ත්‍රාත් ලියවිලි සහ කොන්ත්‍රාත් කොන්දේසි අනුව මහනගර සභා විසින් කරනු ලබන සියළු කොන්ත්‍රාත් වැඩ මහනගර සභා ඉංජිනේරු වරයා විසින් සහතික කර, ඒ සඳහා ගෙවීම් කළ යුතුවූවත්, එයට පටහැනිව රු. 38,862,954 ක් වටිනා කොන්ත්‍රාත් වැඩ 16 ක් තාක්ෂණ නිලධාරි විසින් සහතික කර ගෙවීම් කර තිබුණි. | මේ වන විට ඉංජිනේරු වරයා විසින් සහතික කර ඇත. | සම්මත කොන්ත්‍රාත් ලියවිලි සහ ගිවිසුම් කොන්දේසි අනුව ගෙවීම් කළ යුතුය. |

## 3.4 සභිකයන් වෙත මුදාහැර තිබූ සම්පත්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් චතුරශ්‍ර වෙළඳ සංකීරණයේ අංක 08 සහ අංක 10 කඩ කාමර 2018 මාර්තු සිට සභාවේ සභිකයන් දෙදෙනකුට මහනගර සභා ආඥා පනතේ 180 වගන්තියට පටහැනිව බදු දී තිබුණි. | නීතියානුකූලව කටයුතු කිරීම සඳහා නීති අංශය වෙත ලිපිගොනු යොමු කර ඇත. | නීතියානුකූලව කටයුතු කළ යුතුය. |